**කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 08** 2018 දෙසැම්බර් 03

# ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතය

2000 අංක 56 දරන මූල්‍ය කල්බදුකරණ පනතෙහි 34 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්මේන්තුවෙහි අධ්‍යක්ෂ විසින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා වන උපරිම පොලී අනුපාතය සම්බන්ධයෙන් මෙම විධානයන් නිකුත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | අදාළත්වය හා විෂය පථය | 1.1 | විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීමේ දී අසාධාරණ පොලී අනුපාතයන් අය කිරීමෙන් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතයක් හඳුන්වා දෙනු ලැබේ. |
| | | 1.2 | මෙම විධානය නිකුත් කල දින සිට ලබා දුන් සියළුම ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා මෙම විධානය අදාළ වේ. |
| 2. | උපරිම පොලී අනුපාතය | 2.1 | විශේෂිත කලබදු මූල්‍යකරණ සමාගම් විසින් ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා අය කරනු ලබන පොලිය සියළුම අනෙකුත් ගාස්තුද ඇතුලත්ව වාර්ෂිකව සියයට 35 කට (වාර්ෂික සඵල පොලී අනුපාතය) නොවැඩි විය යුතුය. |
| 3. | ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්ථ දැක්වීම | 3.1 | ක්ෂුද්‍ර ව්‍යවසායයන් පිහිටුවීම සහ කළමනාකරණය සඳහා ලබා දුන් ණය ඇතුලත්ව, තනි පුද්ගලයන්ට/කණ්ඩායම් ණය ක්‍රම යටතේ තනි පුද්ගලයන්ට ආදායම් උපදවන ක්‍රියාකාරකම් සඳහා ලබා දුන් ණය. |
| 4. | වාර්තා කිරීමේ අවශ්‍යතා | 4.1 | විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින්, මූල්‍ය තොරතුරු ජාල පද්ධතියෙහි (FinNet) එන්බීඑල්-එම්එෆ්-03-බීඑස් - ශේෂ පත්‍රය යන වාර්තාවෙහි 3.1.4.9.0.0. - ක්ෂුද්‍ර මූල්‍ය ණය යන කේතය යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වාර්තා කළ යුතුය. |
| 5. | අර්ථ නිරූපනයන් | 5.1 | වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 15 ට අඩු සහ සේවක සංඛ්‍යාව 10 ට අඩු, නිෂ්පාදනය සහ සේවා අංශයෙහි නියුතු ව්‍යවසායයන්, ක්ෂුද්‍ර ව්‍යවසායයන් ලෙස හැඳින්වේ.<br>(මූලාශ්‍රය : කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කල සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති අනුකූලතා රාමුව) |

ඩබ්. රණවීර
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය**
**ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**